teachmore.lk

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

ඉංග්‍රීසි විෂයය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය/ ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණ සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් රජයේ විශ්ව විද්‍යාලවලට ඇතුළත් කිරීම 2025/ 2026 අධ්‍යයන වර්ෂය

2025/ 2026 අධ්‍යයන වර්ෂයෙන් ආරම්භ කරනු ලබන පහත සඳහන් පාඨමාලා හැදෑරීම පිණිස ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශව විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය/ ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් රජයේ හෝ රජය විසින් අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. කලා උපාධි පාඨමාලාව (ඉංග්‍රීසි විෂයය සහිතව)
II. විද්‍යාවේදී උපාධි පාඨමාලාව (ජෛවීය විද්‍යා/ භෞතීය විද්‍යා/ ව්‍යවහාරික විද්‍යා)

02. අයදුම්කරුවන් මේ සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :

I. (*අ*) කලා පාඨමාලාවට අයදුම් කිරීම සඳහා, 2021 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයක දී ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය/ ශාස්ත්‍රෙවිදී (බාහිර) පළමු පරීක්ෂණය සමත්ව තිබීම.

(*ආ*) ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා යන පාඨමාලාවට අයදුම් කිරීම සඳහා, 2021 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයක දී විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත්ව තිබීම.

II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ගුරුවරයකු වශයෙන් අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර අදාළ ගුරු පත්වීම ස්ථිර කර තිබිය යුතු ය.

III. තෝරාගනු ලබන අවස්ථාවේ දී ගුරු අභ්‍යාස විද්‍යාලයක, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක, ජාතික අධ්‍යාපන ආයතනයේ උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී නොසිටීම;

*හෝ*

ශ්‍රී ලංකා රජයේ විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර උපාධි පාඨමාලාවක් (මුදල් ගෙවීමකින් තොරව) හැදෑරීම සඳහා ලියාපදිංචි වී නොසිටීම.

teachmore.lk



IV. යම් විශ්වවිද්‍යාලයක පවත්නා ජෛවීය විද්‍යා, භෞතිය විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා පාඨමාලාවක් සම්බන්ධයෙන් වූ විට, අදාළ පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේ දී හෝ අදාළ විශ්ව විද්‍යාලය විසින් පූර්ව අවශ්‍යතාවක් ලෙස දක්වන ලබන විෂයයන් සඳහා සාමාර්ථ ලබා තිබීම.

**V. පූර්ණ කාලීන පාඨමාලාව සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට හිමිකම ඇති ගුරුවරයෙක් විය යුතු ය. (වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට ඇති හිමිකම් පිළිබඳ සම්මුඛ පරීක්ෂණයේ දී විමසා බලනු ලැබේ.)**

03. රජයේ ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කළ යුතු අතර, රජය විසින් අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ගේ අයදුම්පත් අදාළ විදුහල්පති/කළමනාකරු විසින් සහතික කළ යුතු ය. එකී අයදුම්පත්වල පාසලේ විදුහල්පති/කළමනාකරු විසින් අදාළ ගුරුවරයා/ගුරුවරිය සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කළ හැකි/ නොහැකි බව සඳහන් කළ යුතු ය.

04. සෑම අයදුම්පතක් ම මෙහි සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට පිටපත් දෙකකින් (02) යුතුව **2026.08.30** දිනට පෙර **"අධ්‍යාපන අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන ශාඛාව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල."** ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම සඳහා අයදුම් පත් 2025/2026 (ගුරුභවතුන් සඳහා)"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

05. මෙම ප්‍රවේශය යටතේ සිසුන් තෝරා ගනු ලබනුයේ ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝජ්‍යතා (බාහිර) පරීක්ෂණයේදී/ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණයේදී හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේදී ලබාගත් මුළු ලකුණු, අදාළ විෂයට ලබා ගත් ලකුණු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු පදනම් කරගෙන ය.

06. මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසුව, මෙකී සුදුසුකම පදනම් කරගෙන උපාධි ගුරු පත්වීම් ලබාදීම පිළිබඳ වගකීමට මෙම අමාත්‍යාංශය බැඳී නොමැත.

07. අයදුම් පත්‍රය, මාධ්‍ය තුනෙන්ම (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ (www.moe.gov.lk) විශේෂ දැන්වීම් තීරයේ පළ කර ඇත.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

07 - 348

teachmore.lk